# සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය

## අංශ ප්‍රධානීන් සඳහා පුරප්පාඩු

සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය මෙරට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සහය දැක්වීම සඳහා ප්‍රමුඛ පෙළ මූල්‍ය ආයතන 13ක් සමඟ සම්බන්ධකර ඇති රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් සහිත ආයතනයකි. ශීඝ්‍රයෙන් වෙනස්වන වෙළඳපොළ ඉල්ලීම්, තාක්ෂණික මාරුවීම් සහ ධාරිතාමය සීමාවන් මඟින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා එල්ල වන අභියෝග ජය ගනිමින්, ආර්ථික වර්ධනය සහ සමෘද්ධිය ප්‍රවර්ධනය කරන ශක්‍ය ව්‍යාපෘතීන් සඳහා මුදල් ප්‍රවාහය මත පදනම් කරගත් ණය ලබාදීම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ණය සුරැකුම් ආයතනය ඇපකර පහසුකම් සපයයි.

සබඳතා කළමණාකරණය කිරීමේ, ක්‍රියාශීලී කණ්ඩායමක් මෙහෙයවීමේ, සීමාවෙන් පිටත චින්තනය තුළින් ඉලක්ක ළඟාකර ගැනීමේ, දත්ත මත පදනම් සහ ජනතාව කෙරෙහි අවධානය යොමු කිරීමේ හැකියාව ඇති නායකයින් අප සොයන්නෙමු. ඔබ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වර්ධනයට බලපෑම් කිරීමට සහ වර්ධනය වේගවත් කිරීමට කැමති අපේක්ෂකයෙක් නම්, අප හා එක්වන්න.

මූලික සුදුසුකම සහ පළපුරුද්ද*

| | |
|---|---|
| **ප්‍රධාන පරිපාලන නිලධාරී/ ප්‍රධාන මූල්‍ය නිලධාරී**<br><br>මෙම අංශය ජාතික ණය සුරැකුම් ආයතනයෙහි මූල්‍ය, ප්‍රසම්පාදන, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කාර්යයන්ට අදාළ සියලුම කටයුතු ක්‍රියාත්මක කරයි. | • මූලික උපාධියක් හෝ මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හෝ ඒ හා සමාන ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය සුදුසුකම.<br>• CA, CIMA, ACCA හෝ CFA,CPA හි වෘත්තීය සුදුසුකම තිබීම<br>• මූල්‍ය, තොරතුරු තාක්ෂණය, ප්‍රසම්පාදන ක්ෂේත්‍රවල අවම වශයෙන් වසර 10ක පළපුරුද්ද සහ මූල්‍ය, තොරතුරු තාක්ෂණය, ප්‍රසම්පාදන ක්ෂේත්‍රවල තනතුරුවල අවම වශයෙන් වසර දෙකක කාලයක ප්‍රායෝගික පළපුරුද්ද. |
| **ප්‍රධාන ඇපකර නිලධාරී**<br><br>ණය සුරැකුම්පත් ඇගයීම, ණය ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම, ණය සුරැකුම් සහතිකපත් නිකුත් කිරීම හා ණය සුරැකුම් නිකුත් කළ ණය නිරීක්ෂණය කිරීම මෙම අංශයේ මූලික මෙහෙයුම් වේ. | • ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ වෘත්තීය සාමාජිකත්වය හෝ ගිණුම්කරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් තිබීම. ඉහත ක්ෂේත්‍රවල ශාස්ත්‍රපති උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් තිබීම අමතර සුදුසුකමකි.<br>• අවම වශයෙන් බැංකු ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව මට්ටමක අවම වශයෙන් අවුරුදු 5ක පළපුරුද්ද සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ණය පරිපාලනය පිළිබඳ අවම වශයෙන් වසර 10ක පළපුරුද්දක් තිබීම. |
| **මානව සම්පත් අංශ ප්‍රධානී**<br><br>ජාතික ණය සුරැකුම් ආයතනයෙහි කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම, සංවර්ධනය කිරීම සහ පුහුණු කිරීම සඳහා අදාළ සියලුම ක්‍රියාකාරකම් මෙම අංශය විසින් සිදු කරයි. | • මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය පිළිබඳව විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබා ගන්නා ලද ඊට සමාන සුදුසුකමක්.<br>• මානව සම්පත් කළමනාකරණය පිළිබඳව වසර 15කට වැඩි සේවා පළපුරුද්ද සහ අවම වශයෙන් මානව සම්පත් අංශය ප්‍රධානී තනතුර හා සමාන සේවා නැඹුරුවක් සහිත තනතුරක ව්‍යාපාර පරිසරයක හෝ බැංකු හෝ මූල්‍ය ආයතනයක සමාන භූමිකාවක වසර 05ක පළපුරුද්ද.<br>• මානව සම්පත් සැලසුම් කිරීම පිළිබඳව පළපුරුද්ද, මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ මෘදුකාංග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම |
| **අවදානම් කළමනාකරණය අංශ ප්‍රධානී**<br><br>ණය අවදානම් තක්සේරු කිරීම, අවදානම් කළමණාකරන රාමුවක් තුළ ණය ගිවිසුම් ඇගයීම හා සංශෝධනය කිරීම, ණය සුරැකුම්වල අවධානම් අවම කිරීමේ සැලසුම් සැකසීම යනාදිය මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. | • මූල්‍ය, මූල්‍ය අවදානම් කළමනාකරණය, සංඛ්‍යාලේඛන, ව්‍යාපාර, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ මූලික උපාධියක් තිබීම හෝ ශාස්ත්‍රපති උපාධියක් හෝ ඉහත ක්ෂේත්‍රයන්ට සමාන හෝ ඉහළ ක්ෂේත්‍රයන්හි සුදුසුකමක් පැවතීම අමතර සුදුසුකමක් වේ.<br>• CA, CIMA, ACCA හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකම් පැවතීම.<br>• මූල්‍ය ක්ෂේත්‍රයේ සාම්ප්‍රදායික අවදානම් කළමනාකරණ මූලධර්ම සහ භාවිතයන් පළිබඳව පුළුල් දැනුමක් සහිතව අවම වශයෙන් වසර 10ක පළපුරුද්ද. |
| **අභ්‍යන්තර විගණන අංශ ප්‍රධානී**<br><br>ජාතික ණය සුරැකුම් ආයතනය තුළ යහපත්, ශක්තිමත් අභ්‍යන්තර පාලන රාමුවක් පවත්වාගෙන යාම මඟින් පූර්ණ ආයතන පාලනයක් සහතික කිරීම මෙම අංශයේ මූලික අරමුණ වේ. | • CA, CIMA හෝ ACCA හි වෘත්තිමය සුදුසුකම.<br>• මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍ර සම්බන්ධ මූලික උපාධිය. බැංකු හෝ මූල්‍ය ක්ෂේත්‍ර පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් පැවතීම අමතර සුදුසුකමකි.<br>• බැංකු සහ මූල්‍ය අංශවල අවම වශයෙන් වසර 10ක අභ්‍යන්තර විගණන පළපුරුද්ද. |

* අයදුම්පත් භාරගැනීමේ අවසන් වන දිනට අයදුම්කරුවන්ගේ උපරිම වයස අවුරුදු 57ක් විය යුතුය.

**ප්‍රධාන වගකීම්**

- සමාගම් ඉලක්ක සමඟ සමපාත වන දෙපාර්තමේන්තු උපායමාර්ග සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීම සඳහා දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය මෙහෙයවීම, උපදේශනය හා කළමනාකරණය කිරීම.
- මෙහෙයුම් විධිමත් කිරීම සඳහා අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය කළමනාකරණය. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ වීම.
- අයවැයකරණය අධීක්ෂණය කිරීම, සම්පත් වෙන් කිරීම, කාර්යක්ෂම භාවිතය, දෙපාර්තමේන්තු කාර්යසාධනය අඛණ්ඩ වැඩිදියුණු කිරීම සහ නවෝත්පාදන අරමුණ ඉටු කර ගැනීම සහතික කිරීම අධීක්ෂණය කිරීම.
- සමාගම් ප්‍රතිපත්ති රෙගුලාසිවලට, කර්මාන්ත රෙගුලාසිවලට අනුකූලවීම සහතික කිරීම සහ මෙහෙයුම් අභියෝගවලට ආමන්ත්‍රණය කිරීම හා විසඳීම.

**කොන්ත්‍රාත් කාලය සහ වැටුප් පැකේජ**

කාර්ය සාධනය මත පදනම්ව වසර 03ක නැවත අලුත් කිරීමේ කොන්ත්‍රාත්තුවක් සහ තෝරාගත් අපේක්ෂකයා සඳහා ආකර්ෂණීය වේතනයක් හිමිවේ.

තෝරාගැනීම් පටිපාටිය

විස්තීර්ණ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් හරහා වන තෝරා ගැනීමේ පරීක්ෂණ ක්‍රියාවලියක් හරහා සිදු කරන අතර, තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අපේක්ෂකයින්ට පමණක් දැනුම්දීම කරනු ලැබේ. අදාළ තනතුර සඳහා ඔබ කැමැත්තක් දක්වන්නේනම්, අදාළ සුදුසුකම් ඔබ සතුව තිබේනම්, ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ සබඳතා තොරතුරු සමඟ සම්පූර්ණ කරන ලද ජීව දත්ත පත්‍රිකාවක් (PDF) ncgi.recruitment@gmail.com විද්‍යුත් ලිපිනයට යොමු කර එහි දෘඩ පිටපතක් 2024 ජූලි 10 වන දිනට හෝ එදිනට පෙර දිනයක ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න. කරුණාකර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සහ විද්‍යුත් පණිවිඩයෙහි විෂය "NCGI - යෙදී ඇති තනතුරේ නම" සඳහන් කළ යුතුය.

**ලිපිනය : කාමර අංක. 207, මහ ලේකම් කාර්යාලය, දෙවන මහළ, ලෝටස් පාර, කොළඹ 01.**